ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023-01-09

පැමිණිලි පාර්ශවය : ඩී.ඩබ්ලිව්. ප්‍රියන්ත මහතා,
ධම්මකුසල මාවත,
එගොඩමුල්ල, අහුංගල්ල.

වගඋත්තර පාර්ශවය : 01. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
අහුංගල්ල.

02. පො.ප. චිත්‍රසිරි මහතා,
පොලිස් ස්ථානය,
අහුංගල්ල.

**පැමිණිලි අංකය : HRC/825/18**

**පැමිණිල්ල :-**

පැමිණිලිකරු තම පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත්තේ, 2017.02.22 වන දින තමාගේ නිවස අවට පිහිටි ඉඩම ශුද්ධ කරමින් සිටිනවිට පිරිසක් පැමිණ පහරදුන් බවත්, එසේ පහරදී නිවසටද අලාභහානි කළ බවත්, පසුව රෝහල වෙත යාමට සූදානම් වන අවස්ථාවේදී අහුංගල්ල පොලිස් ස්ථානයේ නිලධාරින් පිරිසක් පැමිණ තමාව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, එසේ ගෙන යන අවස්ථාවේදී තමාගේ වම් අතේ වැලිමිට ප්‍රදේශයේ අගල් 6 ක් පමණ පහළින් කැඩී තිබූ බවත්, ඔළුවේ තැනින් තැන ගෙඩිගැසී ඉදිමී තිබූ බවත්, වම් අතේ දෙවන ඇඟිල්ලේ නියපොත්තෙන් පහළ කැපුම් තුවාලයක් තිබූ බවත්ය. එසේ තුවාල වී තිබූ බැවින් ප්‍රතිකාර සඳහා රෝහල වෙත ඉදිරිපත් කරන ලෙස චිත්‍රසිරි නැමැති නිලධාරියාගෙන් ඉල්ලීම් කිරීමේදී ඔහු පරුෂ වචනයෙන් බැනවැදී දින 14 ක් බන්ධනාගාර ගත කරන බවට ප්‍රකාශ කර එය ප්‍රතික්ෂේප කළ බවත්, පසුව තමාව පොලිස් සිර මැදිරියට දැමූ බවත් දක්වා ඇත. තමා සමග තමාට පහරදුන් විනෝද් රොහාන් ද සිල්වා යන අයද රැගෙන ගිය බවත්, අනතුරුව දෙදෙනාම උපසේවයට භාරදුන් බවත්, පසුව චිත්‍රසිරි නැමති පොලිස් නිලධාරි මහතා විනෝද් රොහාන් යන අයව එම අවස්ථාවේදීම කිසිදු ප්‍රකාශයක් හෝ ලබානොගෙන නැවත නිවසට යැවූ බවත්, තමාව පමණක් පොලිස් සිර මැදිරියට දැමූ බවත්, දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තවද, පැමිණිලිකරුගේ අතේ හා ඇඟිල්ලේ දැඩි වේදනාවක් තිබූ නිසා අවස්ථා කිහිපයකදීම රෝහල වෙත ගෙනයන ලෙසට ඉල්ලා සිටි බවත්, පැමිණිලිකරුව බැලීමට ඥාතින්ට ඉඩ නොදුන් බවත්, තමාව රෝහල වෙත ගෙනනොගිය නිසා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික ඇමතුමට දැනුම්දුන් බවත්, එවිට විත්‍රසිරි මහතා සහ තවත් නිලධාරියෙක් පැමිණිලිකරුට කිසිදු තුවාලයක් නොමැති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරියා වෙත ප්‍රකාශ කළ බවත්, ඇගේ සීරීමක් හෝ නොමැති බවට සඳහන් කළ බවත් දක්වා ඇත. එදින රාත්‍රී 12.00 ට පමණ විත්‍රසිරි මහතා සහ තවත් පොලිස් නිලධාරියෙක් පැමිණ තමාව පොලිස් සිරමැදිරියෙන් එළියට ගෙන අත් දෙක ඔසවන ලෙසට ප්‍රකාශ කළ බවත්, පැමිණිලිකරු දකුණු අත පමණක් එසවිය හැකි බව හා වම් අත එසවිය නොහැකි බවට ඔවුන්ට ප්‍රකාශ කළ බවත්, එවිට ඔවුන් වම් අත ඔසවා එය දැඩි ලෙස මිරිකූ බවත්, එහිදී උහුලා ගත නොහැකි වේදනාවක් දැනුනු බවත් සඳහන් කර ඇත.

පසුව 2018.02.23 දින උදේ අහුන්ගල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පත්මලාල් මහතාට පැමිණිලිකරු ඉදිරිපත් කළ බවත්, එවිට පැමිණිලිකරු ඔහුගේ රෝගී තත්ත්වය ප්‍රකාශ කළ බවත්, එහිදී ද තම ඉල්ලීමට ඉඩ නොදුන් අතර, පසුව එදින අධිකරණයට ඉදිරිපත් කළ බවත් දක්වා ඇත. පසුව පැමිණිලිකරු බලපිටිය මූලික රෝහලේ වාට්ටු අංක 01 හි ප්‍රතිකාර ලබාගත් බව පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වේ. මෙම අය 2018.02.23 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත නිදහස් වී රෝහලට ඇතුලත් වූ බවද පැමිණිල්ලෙන් දක්වා ඇත.

<u>අහුංගල්ල, එගොඩමුල්ල, ධම්මකුසල මාවත යන ස්ථානයේ පදිංචි දූවගේ සීතා</u> යන අය පැමිණිල්ලට සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2018.02.22 වන දින තමා තම සහෝදරයෙකුගේ නිවසේ සිටියදී පස්වරු 5.00 - 6.00 ත් අතර තමාට ලැබුනු දුරකථන ඇමතුමක් අනුව විමල් ප්‍රියන්ත නැමැති තම සහෝදරයා හට අසල්වැසි පුද්ගලයන් විසින් පහර දී ඇති බවත්, එනිසා කඩිනමින් නිවසට පැමිනෙන ලෙසට දැන්වූ බවත්, ඒ අනුව පස්වරු 6.30 ට පමණ එම ස්ථානයට ගිය බවත්, ඒ වනවිට විමල් ප්‍රියන්ත යන අය අහුංගල්ල පොලිස් ස්ථානයට ගෙන ගොස් තිබූ බවත්, ඒ අනුව තමා අහුංගල්ල පොලිස් ස්ථානයට ගිය බවත්, ඒ අවස්ථාවේදී රාජකාරි කරමින් සිටි විත්‍රසිරි මහතා සහෝදරයා හමුවීමට අවස්ථාවක් ලබානොදුන් බවත්ය. පසුව මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික ඇමතුම් අංකයට කථා කර ඒ බව පැමිණිලි කළ බවත්, පසුව කොමිෂන් සභාවේ දැනුම්දීමක් අනුව පොලිස් ස්ථානයට ගොස් නිමල් ප්‍රියන්ත යන අයව හමුවූ බවත්, ඒ අවස්ථාවේදී ඔහුගේ අත කැඩී ඇති බවත්, හිස ගෙඩි ගැසී ඇති බවත්, ඔහුගේ අතේ කැපුම් තුවාලයක් ඇති බවට තමා දුටු බවත් සඳහන් කර ඇත. එම අවස්ථාවේදී පොලිස් නිලධාරීන් ඔහුට බැණවදිමින් සිටි බව ද, 2018.02.23 වන දින නිමල් යන අයව බලපිටිය අධිකරණය වෙත ඉදිරිපත් කළ බවත්, එහිදී ඇප ලැබීමෙන් අනතුරුව බලපිටිය රෝහලට ඇතුලත්වී ප්‍රතිකාර ලබාගත් බවත් එම දිවුරුම් ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු රෝග විනිශ්චය තුණ්ඩුවේ පිටපතක් කොමිෂන් සභාව වෙත ලබාදී ඇති අතර, 2018.02.23 වන දින රෝහලට ඇතුලත් කර 2018.02.24 වන දින රෝහලෙන් පිටවී ඇති බවත්, රෝග විනිශ්චය තුණ්ඩුවේ වැලමිටින් පහළ සහ අතේ තුවාල ඇති බවත් සඳහන් වේ.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ලට අදාලව වගඋත්තර පාර්ශවයෙන් වාර්තාවක් කැඳවා ඇති අතර, ස්ථානාධිපති, අහුංගල්ල විසින් දන්වා ඇත්තේ, 2018.02.22 වන දින අහුංගල්ල පොලිස් වසමේ ධම්මකුසල මාවත, එගොඩමුල්ල, අහුංගල්ල යන ලිපිනයේ පදිංචි අප්පුහෙත්ති සීලවතී යන අය පහරදීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කර තිබූ බවත්, එම පැමිණිල්ලට අදාලව 2018.02.22 වන දින 119 මධ්‍යස්ථානයෙන් ලද දුරකථන පණිවිඩයට අදාලව පොලිස් ස්ථානයේ දිවා ජංගම සංචාරයේ රාජකාරියේ යෙදී සිටි පො.සැ. 21695 ඇතුළු නිලධාරින් ස්ථානයට ගොස් පරීක්ෂා කල බවත්, ඒ අනුව විනෝදන් රොහාන් ද සිල්වා යන අය සහ යොහාන් කාවින්ද සිල්වා යන අය පහරදීම් සම්බන්ධයෙන් 2018.02.28 වන දින අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන් වේ.

තවද, ඉහත පැමිණිලිකරුගේ පැමිණිල්ලට අදාලව පහරකෑමට ලක්වූ විමල් ප්‍රියන්ත යන අයගේ ප්‍රකාශයන් සටහන් කරගෙන ඇති අතර, ස්ථානය පිලිබඳ නිරීක්ෂණ සටහන් හා ඡායාරූප ගත කර ඇති බවත්, පහරදීම් සිදුකල විනෝද් රොහාන් ද සිල්වා සහ යොහාන් කවින්ද සිල්වා යන අය 2018.03.01 වන දින බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර සාමයෙන් සිටින ලෙසට තරයේ අවවාද කර ශරීර ඇප මත මුදා හැර ඇති බවත් දක්වා ඇත.

අහුංගල්ල පොලිස් ස්ථානයේ 119 දුරකථන ලේඛනය අනුව 2018.02.22 වන දින අහුංගල්ල එගොඩමුල්ල මුහුදු තීරයේ විමල් ප්‍රියන්ත යන අය අනවසරයෙන් ගස් කපන බවට පැමිණිල්ලක් ලැබී ඇති බවත්, ඒ අනුව ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරින් වෙරළ තීරයේ වෙරළ ආරක්ෂාවට ඇති වැටකෙයියා ගස් කැපීම සම්බන්ධයෙන් හා UTR 17917 දරණ රණ්ඩු දබර කර තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කල බවත්, නිසංසල ධනංජය සිල්වා යන අය බලපිටියේ රෝහලේ වාට්ටු අංක 01 හි ප්‍රතිකාර ලබමින් සිටි බවත්, ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් විමල් ප්‍රියන්ත යන අයව "වෙරළ බාදනයට හා වෙරළ ආරක්ෂාවට ඇති රුහැන් ගස් කැපීම හා වැටෙකෙයියා ගස් කපා විනාශ කිරීම සහ අවුරුදු 13 ක් වයසැති දරුවෙකුට කැත්තකින් ගසා රණ්ඩු දබර කර ගැනීම" යන වරද කියාදී පැය 17.45 ට අත්අඩංගුවට ගෙන රණ්ඩු දබර කිරීමට උපයෝගි කරගන්නා ලද කැත්ත ද පොලිස් භාරයට ගත් බවත්, එම සැකකරුගේ වම් අතේ දබර ඇඟිල්ල කැත්තට කැපී සීරීම් තුවාල ඇති වූ බවත්, එදින උපසේවයේ රාජකාරි කල උපසේවා පො.කො. 25309 නිලධාරියා වෙත භාරදී ස්ථානාධිපතිගේ නියෝග ලැබෙන තෙක් රඳවා සිටින බවත්, භාරගැනීමේදී විමල් ප්‍රියන්ත යන අයව පරීක්ෂා කර භාරගත් බවත්, ඔහුගේ වම් අතේ මාපටැගිල්ලේ සුළු තුවාලයක් ඇති බවත්, වම් අතේ වැලමිට පහළ කොටස රිදෙන බවට ප්‍රකාශ කළ බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, 2018.02.23 වන දින රාත්‍රි 9.10 ට සැකකාර විමල් ප්‍රියන්ත යන අයගෙන් පො.සැ. 25458 සුදුසිංහ යන අය ප්‍රකාශයක් සටහන් කර ගෙන ඇති අතර, මෙම සැකකරුගේ වම් අතේ දබර ඇඟිල්ලේ නියපොත්ත යට පැත්තේ පළමු පුරුකේ තරමක තුවාල කැළලක් ඇති බවත් ඔහුට පහරදුන් බවත්, වම් අත කැපී ඇති බවත්, අතේ කැක්කුමක් පවතින බවත් සඳහන් කර ඇති බවත් දක්වා ඇත.

පළවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති අහුංගල්ල පොලිස් ස්ථානයේ හිටපු ස්ථානාධිපති පො.ප. ඒ.එච්.එස්.පත්මලාල් මහතා කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ 2018.02.22 වන දින තමා පුහුණු වැඩසටහනක් සඳහා කොළඹට පැමිණ සිටි බවත්, එදින අහුංගල්ල පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරනු ලැබුවේ පො.ප. චිත්‍රසිරි මහතා බවත්, තොරතුරු සටහන් පොත් වලට අනුව 2018.02.22 වන දින 119 අංකයට ලද දුරකථන ඇමතුමක් අනුව විමල් යන අය අනවසරයෙන් ගස් කපන බවත්, ඒ සම්බන්ධයෙන් පරීක්‍ෂා කිරීමේදී දෙපාර්ශවයක් අතර ඇතිවූ ආරවුලක් හේතුවෙන් පාසල් වයසේ පසුවන දරුවෙකුගේ අතට කැති පහරක් වැදී තුවාල වී තිබීම සම්බන්ධයෙන් එම දරුවා රෝහල් ගත කර ඇති බවත්, එම පැමිණිල්ල මත විමල් ප්‍රියන්ත යන අයව පැය 17.45 ට අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කළ බවත්, පසුදින බලපිටිය ගරු මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක 9057 යටතේ ඉදිරිපත් කර රු. ලක්‍ෂය බැගින් ශරීර ඇප මත සාමයෙන් සිටින ලෙසට අවවාද කර මුදාහැර ඇති බවත්ය. පොලිස් ස්ථානයෙන් සැකකරුට ඇප ලබාදීමක් සිදුකළහොත් පාසල් වයසේ පසුවන තුවාලකරුවෙකු රෝහලේ ප්‍රතිකාර ලබන බැවින්, බරපතල සාමය කඩවීමක් ඇතිවන හෙයින් අධිකරණයට ඉදිරිපත් කළ බවත්, පහරදීමක් සිදුකර ඇත්නම් අධිකරණයට ඉදිරිපත් කරන විට ගරු මහේස්ත්‍රාත්වරයාට කරුණු ඉදිරිපත් කිරීමට හැකියාව තිබූ බවත්ය දක්වා ඇත.

දෙවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.ප. එච්.චිත්‍රසේන යන අය කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එහිදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිල්ලේ ඇති සියළු කරුණු ප්‍රතික්‍ෂේප කරන බවත්, අත්අඩංගුවට ගත් අයට අමානුෂික අන්දමින් නොසැලකූ බවත්, පැමිණිල්ල සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත් බවත්, ස්ථානාධිපති ස්ථානයට පැමිණි පසු දෙපාර්ශවයට නඩු පැවරීමට කටයුතු කළ බවත්, කිසිදු අවස්ථාවක ද්වේෂ සහගත ලෙස හෝ පක්‍ෂපාතිව ක්‍රියා නොකළ බවත්ය.

අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, අදාළ සැකකරු 2018.02.22 වන දින පැය 17.45 ට අත්අඩංගුවට ගෙන පැය 18.15 ට උපසේවයට බාරදී ඇති බවත්, 2018.02.23 වන දින උදෑසන 8.50 ට පමණ ඔහුගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලද බවත්ය.

තමා එදින වැඩ බලන ස්ථානාධිපති ලෙස රාජකාරි කළ බවත්, මෙම පැමිණිලිකරුට ආහාර ලබාදීමට සහ ඔහු බැලීමට අවසර දීම ප්‍රතික්‍ෂේප කිරීම යන චෝදනාව සහ ඔහුගේ අත කැඩී ඇති බවත්, ඒ සඳහා ප්‍රතිකාර අවශ්‍ය බවට ඉල්ලීම් කිරීමේදී එම ප්‍රතිකාර ලබාදීම ප්‍රතික්‍ෂේප කරන ලද බවට කරන ලද චෝදනා සම්බන්ධයෙන් වගඋත්තරකරු සඳහන් කර සිටින්නේ සැකකරුවෙකු බැලීම, ආහාර ලබාදීමට අවසර දීම උපසේවා නිලධාරියාගේ කාර්ය භාරයක් බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කරන ආකාරයට එවැනි කටයුත්තක් නොකළ බවත්ය.

**නිරීක්‍ෂණ :-**

දුවගේ සීතා යන අය ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය අනුව පැමිණිලිකරු 2018.02.22 වන දින පොලිස් ස්ථානයේ රඳවා සිටි බවත්, ඔහුගේ අතේ සහ ශරීරයේ තුවාල ඇති බවට තමා දුටු බවත්, ඒ බව අදාළ අය තමා වෙත ප්‍රකාශ කළ බවත් දක්වා ඇති බව නිරීක්‍ෂණය වේ.

වගඋත්තර පාර්ශවය ලබාදී ඇති වාර්තා වලට අනුව උපසේවා නිලධාරියා සැකකරු භාරගන්නා අවස්ථාවේදී සැකකරු පරීක්ෂා කිරීමේදී වම් අතේ මාපටැඟිල්ලේ කැපුම් තුවාලයක් තිබූ බවට සටහන් යොදා ඇති අතර, එම සැකකරුගේ අතේ වේදනාවක් ඇති බවට එම නිලධාරියාට ප්‍රකාශ කල බවට සටහන් යොදා ඇති බව නිරීක්ෂණය වේ. තවද, එම සටහන් අනුව පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුගේ ශරීරයේ සහ අතේ තුවාලයක් තිබී ඇති බවට නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු තමා ප්‍රතිකාර ලබාගත් රෝග විනිශ්චය තුණ්ඩුව ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව තුවාල සඳහා ප්‍රතිකාර ලබාගත් බවත්, වම් අතේ වැලමිටට පහළ කොටසේ තුවාල ඇති බවට දැක්වීම තුළින් පැමිණිලිකරුගේ ශරීරයේ තුවාල තබූ බව ද නිරීක්ෂණය වේ.

යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා තබා ගන්නා අවස්ථාවකදී ඔහුගේ අසනීප තත්ත්වයන්ට නිසි ප්‍රතිකාර ලබාදීම, රඳවා තබා ගන්නන්ගේ වගකීමක් වන අතර, පැමිණිලිකරු ප්‍රතිකාර අවශ්‍ය බවට ඉල්ලීම් කර තිබියදීත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීම තුළ පැමිණිලිකරු කෲර හා අමානුෂික වූ අවමන් සහගත සැලකිල්ලකට ලක්වී ඇත.

අමානුෂික සැළකිල්ලක් යනු දරුණු ශාරීරික හෝ මානසික පීඩාවකට පැමිණවීමක් වන අතර, එය කුරුරු හා මිලේච්ඡ රුදවුම් තත්ත්වයක හෝ නිදහස සීමා කිරීමක් තුළ සිදුවිය හැක.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් නීත්‍යානුකූලභාවය, වෙනස්කොට නොසැලකීම, සමානුපාතිකත්වය සහ මනුෂ්‍යත්වය යන මූලධර්ම වලට ගරු කළ යුතු අතර, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් කිසිදු තත්ත්වයක් යටතේ කිසිදු පුද්ගලයෙක්ව වධහිංසාවකට පැමිණවීම් හෝ වෙනත් කෲර අමානුෂික හෝ පහත් ලෙස සැලකීමකට භාජනය නොකළ යුතුය.

මෙම පැමිණිල්ලට අනුව පැමිණිලිකරු අත්අඩංගුවට පත්වී සිටියදී අත තුවාල වී වේදනාකාරීව සිටින අවස්ථාවේදී ඒ සඳහා ප්‍රතිකාර අවශ්‍ය බවට ඔහු ඉල්ලීම් කර තිබියදීත් කිසිදු තැකීමක් නොකර නිසි ප්‍රතිකාර ලබාගැනීමට අවස්ථාව නොදී පැය 24 ක කාලයක් තුළ එම වේදනාකාරීත්වය තුළම රඳවා තබාගැනීම තුළින් පැමිණිලිකරු කෲර, අමානුෂික සැලකිල්ලකට ලක් කර ඇති බවට කරුණු තහවුරු වේ.

**නිගමනය =:**

එබැවින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙන් සහතික කොට ඇති වධහිංසාවෙන් තොරවීමේ අයිතිය, කෲර හා අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලකට භාජනය වීමෙන් තොරව ජීවත්වීමේ අයිතිය 02 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කොට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 02 වන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බවට අනාවරණය වී ඇති බැවින්, 02 වන වගඋත්තරකරුගේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙත මෙම නිර්දේශය යොමු කරමු.

2023.02.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආ.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා.
මහජන ආරක්ෂක අමාත්‍යංශය.
14 වන මහල සුහුරුපාය.
බත්තරමුල්ල.

02. ~~නියෝජ්‍ය~~ පොලිස්පති (නීති).
පොලිස් මූලස්ථානය.
කොළඹ.

03. සභාපති.
ජාතික පොලිස් කොමිෂන් සභාව.
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව.
කොළඹ 07.

B/